
# 7. ජනගහනය, ශ්‍රම බලකාය සහ සේවා නියුක්තිය

## 7.1 ජනගහනය

ශ්‍රී ලංකාව ඉතා කෙටි කාලයකින් සහ සාපේක්ෂව අඩු ඒක පුද්ගල ආදායම් මට්ටමක් යටතේ ප්‍රජා විද්‍යාත්මක විකාශයේ වඩාත් දියුණු අවස්ථාවට ළඟා වූ ආසියාතික රටවල් කිහිපයකින් එක් රටකි. 1871 ප්‍රථම ජන සංගනණය පවත්වන අවස්ථාවේදී ශ්‍රී ලංකාවේ ජනගහනය දශලක්ෂ 2 1/2 ටත් වඩා අඩු විය. ශත වර්ෂයක් ගත වූ පසු ජනගහනය දශලක්ෂ 10 කින් වැඩි වී 1971 ජන සංගණනයට අනුව දශලක්ෂ 12 1/2 ක් විය. 1871 ජනගහන මට්ටමේ සිට ජනගහනය මුලින්ම දෙගුණයක් වීමට ගත වූයේ වර්ෂ 50 ක් වුවත් නැවතත් එය දෙගුණ වීමට ගත වූයේ වර්ෂ 35 ක් පමණ කාලයකි. 1946 ට පෙර රටෙහි ප්‍රජා විද්‍යාත්මක ලක්ෂණය වූයේ ඉහළ මරණ අනුපාතිකයක් සහ ඉහළ උපත් අනුපාතයක් පැවතීමයි. 1940 ගණන් වල මැද භාගයේ ක්‍රියාත්මක වූ මැලේරියා තුරන් කිරීමේ ව්‍යාපාරය ප්‍රජා විද්‍යාත්මක විකාශයේ දෙවන අවස්ථාව ලෙස සැලකෙන 1946 සිට 1960 දක්වා කාලය තුළ මරණ අනුපාතිකය අඩුවීම කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති වුනි. මෙම කාල පරිච්ඡේදයේ මූලික ලක්ෂණයක් වූයේ පහත වැටෙන මරණ අනුපාතිකයක් සහ ඉහළ උපත් අනුපාතිකයක්ය. දළ උපත් අනුපාතිකය 1990 ගණන් දක්වා නොකඩවා පහළ බැසීමට පටන් ගත්තේ 1960 ගණන්වල සිටය. 1971 සිට ජනගහන වර්ධනය වේගය අඩුවීමේ පැහැදිලි උපනතියක් දක්නට ලැබුණි.




රූප සටහන 7.1
දළ උපත් අනුපාත සහ දළ මරණ අනුපාත

1990 සිට 1995 දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකාවේ ජනගහනය වාර්ෂිකව සියයට 1.3 කින් වර්ධනය වුණි. මෙම වර්ධනය 1996 දී සියයට 1.1 ක් විය. මධ්‍ය වාර්ෂික ජනගහනය 1996 දී දශලක්ෂ 18.3 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර මෙය ඕස්ට්‍රේලියාවේ ජනගහනයට බොහෝදුරට සමාන වේ. ජීවිත අපේක්ෂාව වර්ෂ 73 දක්වා දීර්ඝ වී ඇත.

ජනගහන පුරෝකථනයට අනුව ඉදිරි වර්ෂ පහ තුළ ශ්‍රී ලංකාවේ ජනගහනය වාර්ෂිකව සියයට 1 කින් පමණ වැඩිවෙතැයි අපේක්ෂා කෙරේ. ශ්‍රම බලකාය ශ්‍රම සැපයුමට සැලකිය යුතු බලපෑමක් ඇති කරමින් සියයට 1 කට මදක් වැඩියෙන් වැඩි වෙනු ඇත.

## 7.2 ශ්‍රම බලකාය

1996 වසරේ ජනගහනය දශලක්ෂ 18.3 ක් වූ අතර ශ්‍රම බලකාය දශලක්ෂ 6.2 ක් විය. (1996 තෙවන කාර්තුව වනවිට) මෙම ශ්‍රම බලකායෙන් දශලක්ෂ 5.5 ක් හෙවත් සියයට 88 ක් සේවා නියුක්තිකයන්ය. ශ්‍රම බලකායේ සහභාගීත්ව අනුපාතය හෙවත් මුළු ජනගහනයෙන් වැඩ කිරීමට හැකි ජනගහනයේ ප්‍රතිශතය සියයට 48.6 ක් විය. එම අනුපාතයේ පිරිමින්ගේ සහභාගීත්වය 1996 දෙවන කාර්තුව වනවිට සියයට 66.2 ක් සහ ස්ත්‍රීන්ගේ සහභාගීත්ව අනුපාතය සියයට 31.3 ක් විය. පිරිමින් ශ්‍රම බලකායට සහභාගීවීමේ අනුපාතය 1990 වසරේ සිට සියයට 64 ත් 67 ක් අතර පැවතුනු අතර ස්ත්‍රී සහභාගීත්වය 1990 දී සියයට 37 සිට 1996 දෙවන කාර්තුවේදී සියයට 31 දක්වා අඩු විය. කාන්තාවන් රැකියා සඳහා පිටරට යෑම මෙම අඩුවීමට තරමක් දුරට හේතු වන්නට ඇත.

**සංඛ්‍යා සටහන 7.1**

**ජනගහනයේ මූලික දත්තයන්**

| වර්ෂය | ජනගහනය (000) | වාර්ෂික වර්ධන අනුපාතය % | දළ උපත් අනුපාතිකය (පුද්ගලයන් දහසකට) | දළ මරණ අනුපාතිකය (පුද්ගලයන් දහසකට) | ජීවිත අපේක්ෂාව (අවුරුදු) |
|---|---|---|---|---|---|
| 1871 | 2417 | 0.9 | 28.5 | 19.4 | 40.0 |
| 1946 | 6657 | 1.5 | 35.4 | 14.3 | 42.2 |
| 1953 | 8098 | 2.8 | 48.0 | 10.4 | 58.2 |
| 1963 | 10582 | 2.7 | 34.1 | 8.5 | 61.7 |
| 1971 | 12690 | 2.2 | 30.4 | 7.7 | 65.5 |
| 1981 | 14847 | 1.7 | 28.2 | 5.9 | 69.9 |
| 1991 | 17247 | 1.5 | 21.0 | 5.5 | 72.5 |
| 1995 | 18112 | 1.4 | 19.3 | 5.8 | ල.නො. |
| 1996 | 18315 | 1.1 | ල.නො. | ල.නො. | ල.නො. |

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව

**සංඛ්‍යා සටහන 7.2**

**ශ්‍රම බලකායේ සහභාගීත්වය (අ)**

| වර්ෂය | මුළු ශ්‍රම බලකාය | ශ්‍රම බලකායේ සහභාගීත්ව අනුපාතය % | | |
|---|---|---|---|---|
| | | මුළු | පිරිමි | ගැහැණු |
| 1992 | 5,808,062 | 48.2 | 65.2 | 31.0 |
| 1993 | 6,032,383 | 49.1 | 65.3 | 33.1 |
| 1994 | 6,078,863 | 48.7 | 65.4 | 32.0 |
| 1995 | 6,106,138 | 47.9 | 64.4 | 31.7 |
| 1996 | 6,217,026 | 48.6 | ල.නො. | ල.නො. |

(අ) 1995 වන තෙක් වාර්ෂික සාමාන්‍ය සහ 1996 තෙවන කාර්තුව

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

මධ්‍යකාලීන ජනගහන පුරෝකථන පදනම් කරගෙන සහ දැනට පවතින ශ්‍රම බලකායේ සහභාගීත්ව අනුපාතය තවදුරටත් පවතිනු ඇතැයි යන උපකල්පන මත පසුගිය වසර පහ තුළ සාමාන්‍යයෙන් වාර්ෂිකව ශ්‍රම බලකායට එකතු වූ ප්‍රමාණය වූ 67,000 සමග සසඳන විට වාර්ෂිකව ශ්‍රම බලකායට 100,000 එකතු වෙමින් වර්ෂ 2001 වනවිට ශ්‍රම බලකාය දශලක්ෂ 6.8 ක් වනු ඇත.

## 7.3 සේවා නියුක්තිය

1996 වර්ෂයේ මැද භාගයේ ඇති වූ ආර්ථික වර්ධනයේ මන්දගාමීත්වය 1996 වසරේ රැකියා උත්පාදනයට බොහෝදුරට බාධකයක් විය. පසුගිය වර්ෂ 5 තුළ රැකියා අවස්ථාවන් වාර්ෂිකව සියයට 1.7 කින් ඉහළ නැගුනේ දළ දේශීය නිෂ්පාදිතයේ වාර්ෂික වර්ධන වේගය සියයට 5.5 ක් වූ විටය. මෙයින් ගම්‍ය වන්නේ රැකියා අවස්ථාවන් සියයට 1 කින් වර්ධනය වීමට ආර්ථිකයේ අඩුම තරමින් සියයට 3.5 ක හෝ සියයට 4.0 ක් පමණ වර්ධනයක් අවශ්‍ය වන බවයි. පසුගිය වසර පහ තුළ වාර්ෂිකව උත්පාදනය වූ රැකියා අවස්ථාවන් 90,000 සමග සසඳන විට 1996 වසරේ රැකියා අවස්ථාවන් 75,000 පමණ උත්පාදනය කෙරුණි. රාජ්‍ය අංශයේ සාපේක්ෂ ප්‍රමාණය සැලකිය යුතු ලෙස අඩුවීම නිසා 1996 වසරේ මුළු රැකියා උත්පාදනයට පෞද්ගලික අංශයේ ක්‍රියාකාරකම් පුළුල්වීම බොහෝදුරට හේතු විය. උත්පාදනය වූ රැකියා අවස්ථාවන් වැඩි වශයෙන් උදා වූයේ පෞද්ගලික අංශයේය. පසුගිය වසරවල මෙන්ම 1996 වසරේදී ආයෝජන මණ්ඩලය නව රැකියා අවස්ථාවන් උදා කිරීමට දායක වුණි.

1996 තෙවන කාර්තුවේදී සේවා වියුක්ති අනුපාතය සියයට 11.6 දක්වා අඩු වූ බවට වාර්තා වුණි. සේවා වියුක්තියේ මෙම අඩුවීමට අසංවිධිත අංශයේ ආර්ථික කර්තව්‍යයන්ගේ ප්‍රසාරණයත් රැකියා සඳහා පිටරට යෑමත් ප්‍රධාන වශයෙන් හේතු වන්නට ඇත.

රාජ්‍ය අංශයේ සේවා නියුක්ති පිළිබඳ මහ බැංකුවේ සමීක්ෂණයට අනුව රාජ්‍ය අංශයේ මුළු සේවා නියුක්තිය 1996 වසරේදී දශලක්ෂ 1.16 ක් ලෙස ඇස්තමේන්තු කොට ඇත. මෙය 1995 වසර සමග සසඳන විට සියයට 11 ක සැලකිය යුතු පහත වැටීමකි. මෙම අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තියේ සියයට 28 ක අඩුවීමයි. වැවිලි සමාගම් පෞද්ගලික අංශයට පැවරීම සහ රාජ්‍ය ව්‍යවසායකයන් ප්‍රතිසංස්කරණය කිරීම අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු විය. වැවිලි සමාගම් පෞද්ගලික අංශයට පවරා දීමේ වැඩපිළිවෙල යටතේ 1996 වසරේ සමාගම් 10 ක් පෞද්ගලික අංශයට පවරා දුනි. රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ප්‍රාදේශීය සභා, සහ පළාත් පාලන ආයතන අයත් වන රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය 1996 වසර අග වනවිට 752,194 ක් ලෙස ඇස්තමේන්තු කොට ඇත. මෙය 1995 වසර සමග සසඳන විට සියයට 2 ක වැඩිවීමකි. රජය 1990 වසරේ චක්‍රලේඛන අංක 44/90 යටතේ හඳුන්වා දුන් විශේෂ විශ්‍රාම ගැනීමේ ක්‍රමය 1997 මාර්තු මස සිට අහෝසි කිරීමට තීරණය කළත් 1996 වසර තුළ විශ්‍රාම යෑමට කැමැත්ත දක්වා සිටියේ පුද්ගලයන් 11,000 පමණි. රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය වැඩිවීම වෘත්තීය, තාක්ෂණික සහ අදාළ සේවා කාණ්ඩයේ අනු කාණ්ඩයක් වූ සෞඛ්‍ය සේවාව තුළින් බොහෝදුරට පිළිබිඹු විය. කෙසේ වුවද රාජ්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය හේතුවෙන් අර්ධ රාජ්‍ය සේවා අංශයේ සේවා නියුක්තිය 1996 වසර තුළ සැලකිය යුතු පහත බැසීමක් පෙන්නුම් කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය අංශයේ (රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය අංශය) මුළු සේවා නියුක්තිය වර්ෂය තුළ දී අඩුවිය.

ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ශ්‍රම බලකාය පිළිබඳ ත්‍රෛමාසික සමීක්ෂනයට අනුව 1996 දෙවන කාර්තුවේදී වෙළඳ සහ හෝටල් සහ ගමනාගමනය, ගබඩාකරණය සහ පණිවුඩ හුවමාරුව යන අංශ හැරුන විට ඉතිරි සියලුම අංශ සේවා නියුක්තියෙහි වර්ධනයට දායක වුන බව පෙනී යයි. මුළු සේවා නියුක්තියෙන් කෘෂිකර්මය, ධීවර සහ පශු සම්පත් අංශයේ සේවයේ නියුක්ත වූවන් සංඛ්‍යාව 1995 දී සියයට 34 සිට 1996 දෙවන කාර්තුව වන විට සියයට 38 දක්වා වැඩි විය. නිෂ්පාදන අංශයේ රැකියා උත්පාදනය සියයට 12 කින් මෙම කාර්තුවේදී වැඩි විය. නිෂ්පාදන අංශයේ රෙදිපිළි සහ ඇගළුම් කර්මාන්තවල වැඩි සේවා නියුක්තියක් පෙන්නුම් කෙරුණි. අදාළ

**සංඛ්‍යා සටහන 7.3**
**ශ්‍රම බලකාය සහ සේවා නියුක්තිය**

| | පුද්ගලයන් දශලක්ෂ | | | | | | වෙනස්වීමේ ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1991 | 1992 | 1993 | 1994 | 1995 | 1996 | 1995 | 1996 |
| මුළු ජනගහනය | 17.247 | 17.405 | 17.619 | 17.865 | 18.114 | 18.315 | 1.4 | 1.1 |
| අවු. 10 සහ ඊට වැඩි ජනගහනය | 11.947 | 12.154 | 12.251 | 12.559 | 12.774 | 12.843 | 1.7 | ලැනො. |
| ශ්‍රම බලකාය (අ) | 5.894 | 5.948 | 6.066 | 6.046 | 6.172 | 6.238 | 2.1 | ලැනො. |
| සේවා නියුක්තිය (අ) | 5.084 | 5.159 | 5.227 | 5.315 | 5.433 | 5.517 | 2.2 | ලැනො. |
| රාජ්‍ය අංශය | 1.307 | 1.291 | 1.295 | 1.325 | 1.307 | 1.161 | -1.4 | -11.2 |
| මධ්‍යම රජය | 0.653 | 654 | 0.676 | 0.700 | 0.738 | 0.752 | 5.4 | 1.9 |
| අර්ධ රාජ්‍ය අංශය | 0.654 | 0.637 | 0.619 | 0.625 | 0.569 | 0.409 | -9.0 | -28.1 |
| පෞද්ගලික අංශය | 3.777 | 3.868 | 3.931 | 3.990 | 4.126 | ලැනො. | 3.4 | ලැනො. |
| ආයෝජන මණ්ඩලය | 0.085 | 0.104 | 0.180 | 0.206 | 0.233 | 0.242 | 13.1 | 3.9 |
| අනෙකුත් | 3.691 | 3.764 | 3.751 | 3.784 | 3.893 | ලැනො. | 2.9 | ලැනො. |
| සේවා වියුක්තිය (අ) | 0.810 | 0.789 | 0.839 | 0.731 | 0.739 | 0.721 | 1.1 | ලැනො. |
| ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය % (අ) | 49.3 | 48.9 | 49.5 | 48.1 | 48.3 | 48.6 | - | - |
| විරැකියා අනුපාතය (අ) | 13.8 | 13.3 | 13.8 | 12.1 | 12.0 | 11.6 | - | - |

(අ) 1995 වනතෙක් 4 වන කාර්තුවෙහි දත්ත සහ 1996. සඳහා 3 වන කාර්තුවෙහි දත්ත

මූලයන්: ජනලේඛණ හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 7.4**

**ශ්‍රම බලකාය සහ සේවා නියුක්තිය (අ)**
**(වසරේ දෙවන කාර්තුව)**

(පුද්ගලයින් දශලක්ෂ)

| | 1990 | 1993 | 1994 | 1995 | 1996 |
|---|---|---|---|---|---|
| ගෘහස්ථ ජනගහනය (අවු. 10 ට වැඩි) | 11.424 | 12.293 | 12.442 | 12.687 | 12.823 |
| ශ්‍රම බලකාය | 6.002 | 6.085 | 6.165 | 6.062 | 6.217 |
| මුළු සේවා නියුක්තිය | 5.031 | 5.258 | 5.362 | 5.339 | 5.502 |
| ආර්ථික අංශ අනුව | | | | | |
| කෘෂිකාර්මික, සත්ව පාලන හා ධීවර | 2.415 | 2.371 | 2.190 | 1.813 | 2.141 |
| පතල් සහ කැනීම් | 0.069 | 0.081 | 0.044 | 0.065 | 0.104 |
| නිමැවුම් | 0.582 | 0.663 | 0.722 | 0.693 | 0.777 |
| විදුලිය, ගෑස් සහ ජලය | 0.018 | 0.037 | 0.027 | 0.018 | 0.026 |
| ඉදිකිරීම | 0.230 | 0.205 | 0.261 | 0.273 | 0.272 |
| වෙළෙඳ සහ හෝටල් | 0.527 | 0.539 | 0.565 | 0.845 | 0.658 |
| ගමනා ගමනය, ගබඩා පහසුකම් සහ පණිවුඩ හුවමාරු | 0.211 | 0.159 | 0.250 | 0.265 | 0.248 |
| රක්ෂණය සහ නිශ්චල දේපල | 0.041 | 0.067 | 0.128 | 0.096 | 0.095 |
| පෞද්ගලික සේවාවන් | 0.808 | 0.848 | 0.973 | 0.954 | 1.005 |
| අනෙකුත් (අන් තැනක සඳහන් නොකළ) | 0.130 | 0.289 | 0.202 | 0.318 | 0.175 |

(අ) උතුරු සහ නැගෙනහිර පළාත් හැර

මූලය : ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රම බලකාය පිළිබඳ ත්‍රෛමාසික සමීක්ෂණය

කාලපරිච්ඡේදයේදී පෞද්ගලික සේවාවන්හි සේවා නියුක්තිය සියයට 5 කින් වැඩි වුණි. මෙය 1995 වසරේදී සියයට 2 කින් අඩුවීම හා සැසඳේ.

පෞද්ගලික අංශයේ සේවා නියුක්තිය පිළිබඳ කාල ශ්‍රේණි දත්ත නොමැති නිසා අර්ථ සාධක අරමුදල්හි ලියාපදිංචි සේවක සංඛ්‍යාව සහ ආයෝජන මණ්ඩලය මගින් උත්පාදනය වූ රැකියා අවස්ථාවන් සංවිධිත පෞද්ගලික අංශයේ සේවා නියුක්තිය ගණනය කිරීමට දර්ශක ලෙස යොදා ගැනේ. 1996 වසර අවසාන වනවිට ආයෝජන මණ්ඩලය මගින් පුද්ගලයින් 241,970 කට රැකියා අවස්ථාවන් සපයා ඇත. මෙය පසුගිය වසර සමග සසඳන විට සියයට 4 ක වර්ධනයකි. මෙම වර්ධනයෙන් සියයට 65 කට දායක වූයේ රෙදිපිළි සහ ඇඟළුම් කර්මාන්තයයි. කටුනායක අපනයන ප්‍රවර්ධන කලාපය සියයට 24 කට පමණ රැකියා අවස්ථාවන් සපයා ඇත. බියගම සහ කොග්ගල අපනයන ප්‍රවර්ධන කලාප තුළ රැකියා උත්පාදනය පිළිවෙලින් සියයට 9 ක් සහ සියයට 2 ක් විය.

සේවා නියුක්තිකයන්ගෙන් වැඩි දෙනා ස්වයං රැකියාවල නිරත වී සිටින සේවා අංශයෙහි වැඩිවන වැදගත්කම එම අංශයෙන් දළ දේශීය නිෂ්පාදිතයට වන දායකත්වයෙන් සහ සේවා නියුක්තියට ඇති වූ දායකත්වයෙන් පිළිබිඹු වේ. විශේෂයෙන්ම කෘෂිකාර්මික නොවන අංශයන්හි ස්වයං රැකියාවන්ගේ වර්ධනය පසුගිය වසර කීපය තුළ දක්නට ලැබුණ වැදගත් ලක්ෂණයකි. ආදායම් උපදවන ආර්ථික ක්‍රියාවන් උද්දීපනය කිරීම සඳහා ප්‍රතිපත්තීන් සකස් කිරීම, ණය පහසුකම් සැලසීම සහ දුප්පත්කම තුරන් කිරීමේ වැඩසටහන් මගින් ශ්‍රමයේ නිපුණතාවයන් වැඩි දියුණු කිරීම ස්වයං රැකියා වර්ධනයට බොහෝදුරට හේතු විය. 1996 වසර තුල දී ජාතික සංවර්ධන අරමුදල සහභාගිත්ව ආයතන මගින් රුපියල් දශලක්ෂ 199 ක් කෘෂිකාර්මික, කාර්මික, පශු සම්පත්, සේවාවන් සහ කුඩා පරිමාණයේ කර්මාන්ත 20,844 ක් සඳහා මුදා හැර ඇත.

## 7.4 විදේශ රැකියා

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට අනුව 1996 වසර තුළ දී පුද්ගලයන් 162,511 පිටරට රැකියාවන් සඳහා ගොස් ඇත. මෙය 1995 වර්ෂයේ වාර්තා වූ 170,130 සමග සසඳන විට අඩුවීමක් පෙන්වන්නේ එම කාර්යාංශය 1995 දී හඳුන්වා දුන් පිටරට යන සෑම පුද්ගලයෙක්ම අනිවාර්යයෙන්ම කාර්යාංශයෙහි ලියාපදිංචි විය යුතුය යන නීතිය 1996 දී ලිහිල් කිරීම නිසාය. 1996 වසර තුළ දී කාර්යාංශය එම නීතිය ලිහිල් කරමින් පිටරට රැකියා සඳහා යන පුද්ගලයන්ගේ පවුල්වල සුභ සිද්ධිය වැඩි දියුණු කිරීම සඳහා නොයෙකුත් සානුබල හඳුන්වා දුනි. ඒ අනුව කාර්යාංශයේ ලියාපදිංචි වී රැකියා සඳහා යන පුද්ගලයන්ට රැකියාවෙහි ආරක්ෂාව සඳහා ඇප වීමක් සහ පිටරට සිටින කාලය තුළ දී රක්ෂණ පහසුකම් සැපයීමද හඳුන්වා දී ඇත. ඔවුන්ගේ දරුවන්ට දිවා සුරැකුම් මධ්‍යස්ථාන ද, පවුල් සඳහා සෞඛ්‍ය රක්ෂණ ක්‍රමයක් ද, දරුවන්ට ශිෂ්‍යාධාර ලබාදීම සහ සේවා නියුක්තිකයන්ට පුහුණුවක් ලබාදීම වැනි දේ කාර්යාංශය මගින් ලබා දී ඇති සානුබලයන්ගෙන් කිහිපයකි. කෙසේ වුවත් මෙවැනි පහසුකම් සැලසුවද, 1996 වසර තුළ දී පිටරට රැකියා සඳහා පිටත්ව ගිය සමහර පුද්ගලයන් පෞද්ගලික දැන හැඳිනීම් මගින් ද රැකියා අවස්ථා සොයා ගන්නට ඇත. එම නිසා 1996 දී වාර්තා වී ඇති සංඛ්‍යාවට වඩා වැඩි පිරිසක් පිටරට රැකියාවන් සඳහා පිටත්ව යන්නට ඇතැයි සිතිය හැකිය. මෙරටට ගලා ආ පෞද්ගලික සංක්‍රාමයන්ගේ නොකඩවා ඇති වූ වර්ධනයෙන් මෙය තවදුරටත් තහවුරු වේ. (1996 වසරේදී ව.ගැ.හි. අගය අනුව සියයට 10) පිටරට රැකියාවන්ගෙන් කැපී පෙනුන ලක්ෂණය නම් රැකියාවන් සඳහා මැද පෙරදිග රටවලට යාම ක්‍රම ක්‍රමයෙන් අඩුවීමත් විදේශීය ශ්‍රමයට ඇති ඉල්ලුමේ මූලාශ්‍රයක් ලෙස මාලදිවයින, සිංගප්පූරුව, හොංකොං සහ ඉතාලිය වැනි රටවල ඇති වැදගත්කම වැඩිවීමත්ය. සිංගප්පූරුව, හොංකොං සහ ඉතාලිය වැනි රටවල ජීවන තත්ත්වය වැඩි දියුණු වීම ශ්‍රමයට ඇති ඉල්ලුමේ අතිරික්තයක් ජනිත කර ඇත. සිංගප්පූරුවේ රැකියා සඳහා පිටත්ව ගිය පුද්ගලයන්ගේ සියයට 81 ක් පමණ ගෘහ සේවිකාවන් විය. මාලදිවයිනේ සංචාරක ව්‍යාපාරය දියුණු වීම විදේශීය ශ්‍රමයට ඇති ඉල්ලුම වැඩි කිරීමට දායක වන්නට ඇත. ශ්‍රමයට ඇති ඉල්ලුම ගෘහ සේවිකාවන්

# සේවා වියුක්තිය මැනීම

සේවා වියුක්තිය පිළිබඳ දත්තයන් කරුණු කීපයක් නිසා වැදගත් වේ. යම්කිසි කාල සීමාවක් තුල රටක රැකියාවන්හි නියුක්ත නොවූ පුද්ගලයන් සංඛ්‍යාව කොතෙක් ද යන්න මෙම දත්තයන්ගෙන් දැන ගත හැකි වන අතර, විරැකියාව පිළිබඳ දත්ත විශ්ලේෂණයෙන් රටක ආර්ථික හා සමාජයීය වැදගත්කමද පෙන්නුම් කරයි. රජය, පර්යේෂකයින් සහ අධ්‍යාපනික ආයතන, රටට ආධාර ලබාදෙන්නන්, මූල්‍ය ආයතන, දේශපාලඥයින් සහ තවත් බොහෝ අය මෙම දත්තයන් බෙහෙවින් භාවිතා කරන නමුත්, නිර්වචන, සංකල්ප, විරැකියාව මැනීම සහ දත්තයන් එක් රැස් කරන ක්‍රමයන්හි ඇති වෙනස්කම් නිසා සේවා වියුක්ති දත්තයන් ඉදිරිපත් කිරීමේදී වඩාත් සැලකිලිමත් විය යුතුය.

ශ්‍රී ලංකාවේ භාවිතා වන්නේ ජාත්‍යන්තර කම්කරු සංවිධානය මගින් 1982 දී පැවැත්වූ ජාත්‍යන්තර කම්කරු දත්තයන් පිළිබඳ සැසියේදී අනුමත කරගන්නා ලද ආර්ථික වශයෙන් ක්‍රියාශීලී පුද්ගලයන්, සේවා නියුක්තිකයන්, සේවා වියුක්තිකයන් සහ ඌණ සේවා නියුක්තිකයන් පිළිබඳ ජාත්‍යන්තර නිර්වචනයයි. මෙම නිර්වචනයට අනුව රැකියාවක් කිරීමට හැකි වයසේ පසුවන පුද්ගලයෙක් සේවා වියුක්තිකයෙක් ලෙස හඳුන්වන්නේ අදාළ පුද්ගලයා යම්කිසි කාල පරිච්ඡේදයක් තුළ දී

රැකියාවක් නොමැතිවීම - අඩුම තරමින් දිනකට පැයක් හෝ යම්කිසි වැටුපකට හෝ ලාභයකට හෝ පවුලේ ආර්ථික සුභසිද්ධිය උදෙසා හෝ ස්වයං රැකියාවක හෝ නිරත නොවීම.

රැකියාවක් කිරීමට ඇති කැමැත්ත - යම්කිසි වැටුපකට හෝ ලාභයකට හෝ පවුලේ ආර්ථික සුභ සිද්ධිය උදෙසා හෝ ස්වයං රැකියාවක හෝ යෙදීමට ඇති කැමැත්ත.

ක්‍රියාශීලීව රැකියාවක් සෙවීම - නියමිත කාලපරිච්ඡේදයක් තුළ වැටුපක් ලබන රැකියාවක් හෝ ස්වයං රැකියාවක් හෝ ක්‍රියාශීලීව සෙවීමට පියවර ගෙන තිබීම.

ශ්‍රී ලංකාවේ විරැකියාව පිළිබඳ දත්තයන් ලබාගත හැකි ප්‍රාථමික මූලාශ්‍රයන් වන්නේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ජන සංගණනයන් සහ ගෘහස්ථ නියැදි සමීක්ෂණයන්, ශ්‍රී ලංකා මහ බැංකුව පවත්වනු ලබන ගෘහස්ථ නියැදි සමීක්ෂනයන් සහ සේවා වියුක්තිකයන් ලියාපදිංචි කිරීමේ වැඩ පිළිවෙලවල්ය. 1946 ට පෙර පැවැත්වූ ජන සංගණන වලින් සේවා වියුක්තිය පිළිබඳ දත්ත එක්රැස් කොට නොමැත. ප්‍රථම වරට විරැකියාව පිළිබඳ දත්තයන් එකතු කරනු ලැබුවේ 1946 පැවැත්වූ ජනසංගණනයෙනි.1953 ජනසංගණනයෙන් සේවා වියුක්තිකයන් ලෙස සලකනු ලැබුවේ කලින් කුමන හෝ රැකියාවක යෙදී එහෙත් දත්ත එක්රැස් කරන අවස්ථාවේදී තාවකාලිකව රැකියා විරහිත පුද්ගලයන්ය. ප්‍රථම වරට රැකියා සොයන්නන් සැලකුවේ සේවා වියුක්තිකයන් මෙන් නොව යැපෙන්නන් ලෙසයි. 1963 පැවැත්වූ ජන සංගණනයෙන් සේවා වියුක්තික සංඛ්‍යාව ඌණ තක්සේරු වී තිබුණි. 1971 ජන සංගණනයේදී සේවා වියුක්තිකයන් පිළිබඳ නිර්වචනය වඩාත් පුළුල් ලෙස රැකියාවක් කිරීමට හැකි නමුත් රැකියාවක් සෙවීමට කිසිම උනන්දුවක් නැති හෝ තමන්ට ගැලපෙන රැකියාවක් සොයා ගැනීමට නොහැකි යයි සිතන පුද්ගලයන් ද (discouraged workers) ඇතුලත් කෙරුණි. 1981 සංගණනයේදී සේවා වියුක්තිකයන් ලෙස සැලකුවේ මුළු ශ්‍රම බලකායෙන් සේවා නියුක්තිකයන් අඩු කර ඉතිරි වූ පුද්ගලයන් කොටසයි. එහෙයින් සංගණන මගින් එක්රැස් කරගත් සේවා වියුක්තිය පිළිබඳ දත්ත එකිනෙකට සැසඳීමේදී නිර්වචනයන්ගේ මෙම වෙනස්කම් නිසා මහත් දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුවේ. එයට අමතරව 1981 න් පසු ජන සංගණනයන් පවත්වා නොමැති හෙයිනුත්, සංගණනයන් අතර කාලයන් තුළ දී දත්ත ලබාගැනීමට වෙනත් මූලාශ්‍ර සොයා ගත යුතුවේ.

එහෙයින් ශ්‍රී ලංකාවේ විරැකියාව පිළිබඳ දත්තයන් ලබාගැනීමට ඇති ජනප්‍රියම මූලාශ්‍රය වන්නේ ගෘහස්ථ නියැදි සමීක්ෂණයයි. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් පවත්වන ශ්‍රම බලකාය පිළිබඳ ත්‍රෛමාසික සමීක්ෂණය පදනම් වී ඇත්තේ තෝරාගත් ගෘහස්ථවලට ගොස් එහි සාමාජිකයන් සමග සම්මුඛ සාකච්ඡා පවත්වා ප්‍රශ්නාවලියට අදාළ තොරතුරු ලබාගැනීමෙනි. මෙම දත්තයන් 1990 ප්‍රථම කාර්තුවේ සිට ලබාගත හැකිය. මෙම සමීක්ෂණය උතුර සහ නැගෙනහිර පළාත් හැර දිවයිනේ ඉතිරි සියලුම ප්‍රදේශවල වාර්ෂිකව ගෘහස්ථ 10,000 ක් ආවරණය කරයි. මෙම නියැදිය ස්වයං රැකියාවල නියුක්ත වුවන්, අනියම් සේවකයන් සහ ගෙවීමක් නොලබන පවුලේ සේවකයන් යන සියලු දෙනාම ඇතුළත් වැඩ කිරීමට හැකි ජනගහනය නියෝජනය වන පරිදි තෝරා ගෙන ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව මගින් පවත්වනු ලබන පාරිභෝගික මූල්‍ය හා සමාජ ආර්ථික සමීක්ෂණයන්ගෙන් ලබාගත් දත්ත 1953, 1963, 1973, 1978/79, 1981/82 සහ 1986/87 වසර වලට ලබාගත හැකිය. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ගණනය කරනු ලබන සේවා වියුක්ති අනුපාතිකයන් අතර වෙනසක් පවතින්නේ ශ්‍රම බලකාය සඳහා භාවිතා කරන නිර්වචනයන් සහ අවම වයස් සීමාවේ වෙනස හේතුකොට ගෙනය. ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව ශ්‍රම බලකායේ අවම වයස අවු. 10 ලෙස සලකන අතර ශ්‍රී ලංකා මහ බැංකුව එය අවු. 14 ලෙස සලකයි.

ගෘහස්ථ සමීක්ෂණවලට අමතරව විරැකියාව පිළිබඳ දත්තයන් නොයෙකුත් පරිපාලන වාර්තාවලින් ද ලබාගත හැකිය. ශ්‍රී ලංකාවේ සේවා වියුක්තිකයන් ලියාපදිංචි කිරීමට රැකියා බැංකු ක්‍රමයක් 1970 ගණන්වල අග භාගයේදී හඳුන්වා දුන් නමුත් එම ක්‍රමයේ ඇති වූ අක්‍රමිකතාවයන් නිසා 1980 ගණන්වල අග භාගයේදී එය අහෝසි කිරීමට සිදුවිය.

සේවා වියුක්තිය පිළිබඳ පරිපාලන වාර්තාවලින් ලබාගන්නා දත්තයන් සාමාන්‍යයෙන් ගෘහස්ථ සමීක්ෂණවලින් ලබාගන්නා දත්තයන්ට වඩා අඩුවෙන් සේවා වියුක්තිය වාර්තා වේ. කෙසේ වුවද, සමීක්ෂණ දත්තයන් සමග සසඳන කළ පරිපාලන වාර්තාවන් ගෙන් ලබාගන්නා දත්තයන් නියැදි දෝෂවලින් තොර අඩු වියදමකින් ලබා ගැනීමට හැකිවනවා මෙන්ම ඉතා ඉක්මණින් එම දත්තයන් ඉදිරිපත් කිරීමට ද හැකිය. කෙසේ වුවද, මෙම වාර්තාවලින් ආවරණය වන්නේ ජනගහනයෙන් කොටසකි. එනම් සේවා වියුක්තිකයන් ලියාපදිංචි කිරීමේ ආයතනවල ලියාපදිංචි වන පුද්ගලයන් හෝ විරැකියා රක්ෂණයට සුදුසුකම්ලබන පුද්ගලයන් පමණි. එම නිසා මෙම මූලාශ්‍රවලින් ලබාගන්නා සේවා වියුක්තිය පිළිබඳ දත්ත එකිනෙකට විකල්පයන් ලෙස නොව අනුපූරක ලෙස භාවිතා කිරීමට සිදුවේ.

සේවා වියුක්තිය නිර්වචනය කිරීම සහ එය මැනීම ඉතාමත් සැලකිල්ලෙන් කළ යුතු කාර්යයකි. නිර්වචනයට අනුව, සේවා වියුක්ති දත්තයන්ගෙන් කිසියම් කාල පරිච්ඡේදයන් තුළ දී ක්‍රියාකාරී ලෙස රැකියා සොයන සහ රැකියා කිරීමට කැමති අය ආවරණය වේ. මෙහිදී කිසියම් නිශ්චිත කාලයකදී වැඩ කිරීමට උවමනා එහෙත් කිසියම් හේතුවක් නිසා හෝ ක්‍රියාශීලීව රැකියා නොසොයන්නන් අත්හැරේ. මෙම දත්තවලින් ආවරණය වන්නේ රටෙහි සේවා වියුක්ති ප්‍රශ්නයෙන් කොටසක් පමණි. එනම් රැකියා හිඟකමයි. ශ්‍රමයෙහි නිපුණතාවයන් නිසි අයුරින් යොදා නොගැනීම සහ අඩු වැටුප් ලබන පුද්ගලයන් සේවා වියුක්තිකයන් ලෙස නොසැලකේ.

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සහ නාගරික ප්‍රදේශවල ඌණ සේවා නියුක්තිකයන් සේවා වියුක්ති වර්ගීකරණයට අයත් නොවේ. අප රටෙහි සියයට 73 ක් පමණ ජනයා ග්‍රාමීය අංශයට අයත් වන අතර මෙම අංශයේ පුද්ගලයන්ට රැකියා විරහිතව සිටීමට නොහැකි නිසා කුමන හෝ අසංවිධිත අංශයේ ආර්ථික ක්‍රියාවලියක යෙදෙයි. මෙහිදී ඔවුන් කිසියම් හෝ ආර්ථික කටයුත්තක යෙදුනත් ඔවුන්ගේ හැකියාවන් නියමිත අයුරින් ප්‍රයෝජනයට ගැනීමක් සිදු නොවේ. මෙයින් කිසියම් කොටසක් වෙනත් රැකියාවක් හෝ අමතර රැකියාවක් බලාපොරොත්තුවෙන් සිටියත් ඔවුන් සලකන්නේ සේවා නියුක්තිකයන් ලෙසයි. උදාහරණයක් ලෙස වැටුප් නොලබන පවුලේ සේවකයන්ගෙන් ආර්ථිකයට ලැබෙන දායකත්වය ඉතාම සුළු වුවත් ඔවුන් සේවා නියුක්තිකයන් ලෙස සලකයි.

සමහර අවස්ථාවන්හිදී පුද්ගලයන් තාවකාලිකව ඉතාමත් අඩුවෙන් වැටුප් ලබන රැකියාවක නියුතු වී තවත් රැකියාවක් සොයමින් පසුවේ නම් ඔවුන් සලකන්නේද සේවා නියුක්තිකයන් ලෙසයි. එහෙත් පාසල් ශිෂ්‍යයෙක් පාසල් යන අතර රැකියාවක් ක්‍රියාශීලීව සොයමින් පසුවුවත් ඔහු ශ්‍රම බලකායට අයත් පුද්ගලයෙක් ලෙස නොසලකයි. මෙවැනි අවස්ථාවන්හිදී බොහෝ විට නිර්වචනයන් වැරදි ලෙස හෝ නොසැලකිල්ලෙන් හෝ භාවිතා කළහොත් සංඛ්‍යාත්මක වර්ගීකරණයෙහි දී විශාල වෙනසක් සිදුවීමට ඉඩ ඇත. නමුත් ආර්ථිකයන්හි මෙවැනි සිද්ධීන් සුලබ නිසා මේවා ඉතාමත් ප්‍රවේසමෙන් අධීක්ෂණය කළ යුතුය.

නිර්වචනයන්හි සහ සංකල්පයන්හි ඇති එකිනෙක නොගැලපීම් නිසා සේවා වියුක්ති දත්තයන් පසුගිය කාලසීමාව තුලදී එකිනෙක සැසඳීමට බාධාවක් වී ඇත.

**විශේෂ සටහන 8 සම්බන්ධයි**

සංඛ්‍යා සටහන

## සේවා වියුක්තිය

| මූලාශ්‍රය | සංඛ්‍යාව | වැඩකළහැකි ජනගහණයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|
| සේවා නියුක්තිය, සේවා වියුක්තිය සහ ඌණ සේවා නියුක්තිය පිළිබඳ සමීක්ෂණය - 1959/ 60 (ජන ලේඛණ හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව) | 340,000 | 10.5 |
| ජන සංගණනය - 1963 (ජන ලේඛණ හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව) | 264,970 | 7.7 |
| පාරිභෝගික මූල්‍ය සමීක්ෂණය - 1963 (ශ්‍රී ලංකා මහ බැංකුව) | 457,700 | 13.8 |
| ශ්‍රම බලකාය පිළිබඳ සමීක්ෂණය - 1968 (ජන ලේඛණ හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව) | 464,200 | 13.4 |
| සමාජ ආර්ථික සමීක්ෂණය - 1968 (ශ්‍රී ලංකා මහ බැංකුව) | 558"600 | 14.3 |
| ජන සංගණනය - 1971 (ජන ලේඛණ හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව) | 839,264 | 18.7 |
| ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාත පිළිබඳ සමීක්ෂනය - 1973 (ශ්‍රී ලංකා මහ බැංකුව) | 793,000 | 18.3 |
| ශ්‍රම බලකා පිළිබඳ සමීක්ෂණය - 1973 (ජන ලේඛණ හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව) | 1,073,000 | 24.0 |
| ඉඩම් සහ ශ්‍රම උපයෝගිතා සමීක්ෂණය - 1975 (ජන ලේඛණ හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව) | 984,300 | 19.7 |
| ශ්‍රම බලකාය සහ සමාජ ආර්ථික සමීක්ෂණය - 1978/ 79 (ශ්‍රී ලංකා මහ බැංකුව) | 874,000 | 14.8 |
| ශ්‍රම බලකාය හා සමාජ ආර්ථික සමීක්ෂණය - 1980/ 81 (ජන ලේඛණ හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව) | 857,168 | 15.3 |
| ජන සංගහණය - 1981 (ජන ලේඛණ හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව) | 859,143 | 17.9 |
| පාරිභෝගික මූල්‍ය හා සමාජ ආර්ථික සමීක්ෂණය - 1981/ 82 (ශ්‍රී ලංකා මහ බැංකුව) | 609,266 | 11.7 |
| ශ්‍රම බලකාය හා සමාජ ආර්ථික සමීක්ෂනය - 1985/ 86 (ජන ලේඛණ හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව) | 840,252 | 14.1 |
| පාරිභෝගික මූල්‍ය හා සමාජ ආර්ථික සමීක්ෂණය - 1986/ 87 (ශ්‍රී ලංකා මහ බැංකුව) | 966,907 | 15.5 |
| ශ්‍රම බලකාය පිළිබඳ ත්‍රෛමාසික සමීක්ෂණය - (ජන ලේඛණ හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව) | | |
| 1990 | 964,331 | 16.3 |
| 1991 | 810,325 | 13.8 |
| 1992 | 789,256 | 13.3 |
| 1993 | 839,494 | 13.8 |
| 1994 | 731,219 | 12.1 |
| 1995 | 739,341 | 12.0 |
| 1996 (තෙවන කාර්තුව) | 720,721 | 11.6 |

මෙම දත්තයන් එකිනෙකට වෙනස් මූලයන් පදනම් කරගෙන ඇති හෙයින් එකිනෙක හා නොසැසඳේ

වැනි නුපුහුණු ශ්‍රමය දෙසට නැඹුරු වී ඇත. කායශීංශයේ දත්තවලට අනුව කාන්තාවන්ගෙන් සියයට 91 ක් පමණ ගෘහ සේවිකාවන් වූ අතර පිටරට රැකියා සඳහා ගිය පිරිමින්ගෙන් සියයට 44 ක් පමණ නුපුහුණු අය විය. පිටරටවලින් නුපුහුණු ශ්‍රමයට ඇති ඉල්ලුම, රටෙහි විරැකියා ප්‍රශ්නය තරමක් දුරට හෝ යටපත් කිරීමට හැකි වී ඇත. කාන්තාවන් වැඩි දෙනෙක් පිටරට රැකියා සඳහා යොමුවීමට ප්‍රධාන වශයෙන් හේතු වන්නට ඇත්තේ ඔවුන්ගේ පවුල්වල දැඩි ආර්ථික දුෂ්කරතාවයන් සහ පිටරට සහ දේශීය රැකියාවන්හි වේතන අතර ඇති විශාල පරතරයයි.

සාමාන්‍ය ඇස්තමේන්තුවලට අනුව, ආර්ථිකය වාර්ෂිකව 90,000 ක් පමණ රැකියා අවස්ථාවන් උත්පාදනය කළහොත් සේවා වියුක්ති අනුපාතය දැන් පවතින මට්ටමට වඩා වෙනස් නොවනු ඇත. කෙසේ වුවද සංඛ්‍යාවක් වශයෙන් ගත් කළ වර්ෂ 2001 වන විට සේවා වියුක්තිය 782,000 ක් පමණ වනු ඇත. රජයේ මූලික පරමාර්ථය වන්නේ සේවා වියුක්ති අනුපාතය සැලකිය යුතු ලෙස අඩු කිරීමයි. ශේවා වියුක්ති අනුපාතිකය සියයට 6 දක්වා අඩු කිරීමට නම් ආර්ථිකය නව රැකියා අවස්ථාවන් වසරකට 158,000 ක් පමණ උත්පාදනය කළ යුතුය. දැනට පවතින ශ්‍රම උපයෝගිතා පරිමාව පදනම් කරගෙන (ආර්ථික වර්ධන වේගයේ සෑම සියයට 3.7 කටම සේවා නියුක්තිය සියයට 1 කින් වැඩිවීම) වර්ෂ 2001 වන විට සේවා වියුක්ති අනුපාතය සියයට 6 දක්වා අඩු කිරීමට වාර්ෂිකව සියයට 7 ක පමන ආර්ථික වර්ධන වේගයක් අවශ්‍ය වේ.